**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව - 2021**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**--------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------**

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව

හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 වර්ෂයේදී ලැබුණු රු.මිලියන 150 ක ප්‍රදාන වලින් 2021 වර්ෂයේ දී රු. 16,162,280 ක දේපල පිරියත මිල දී ගෙන තිබුණද 2019 වර්ෂයේ සිට සම්පූර්ණ රාජ්‍ය ප්‍රදානය ක්‍රමක්ෂය කර තිබීම නිසා 2021 වර්ෂයේ මිලදීගෙන තිබුණු වත්කම් වලට අදාලව රාජ්‍ය ප්‍රදානයද ක්‍රමක්ෂය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව රු. 3,232,456 කින් වෙනත් ආදායම් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම කරුණ යටතේ සඳහන් කර ඇති රු.මි.18,252,714.00 ක් වටිනා යන්ත්‍ර පිරියත 2019 වර්ෂයේදී රජයේ ප්‍රදානයන් ලෙස ලද රු.මි.150 ක් වූ ප්‍රාග්ධන අයිතම තුල ඇතුලත් වූ වටිනාකමකි.එම මුළු වටිනකාම 2020 වර්ෂයේ සිට ක්‍රම ක්ෂය කිරීම ආරම්භ කර වාර්ෂිකව ක්ෂය කරමින් පවතී. එබැවින් 2021 වර්ෂයේදී වත්කම් ගිණුමට මාරු කරන ලද ඉහත වටිනාකම නැවත 2021 වර්ෂයේදී ක්ෂය කල යුතු නොවේ. | ක්‍රමක්ෂය නිවැරදිව ගණනය කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 24 (LKAS 24) හි 17 වැනි වගන්තිය අනුව මූල්‍ය ප්‍රකාශනවල සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳව හෙලිදරව් කිරීම් කළ යුතු වුවද සංස්ථාව විසින් ප්‍රධාන කළමනාකාරීත්වයේ පුද්ගලයන් සම්බන්ධයෙන් වන සමාලෝචිත වර්ෂයේ පාරිශ්‍රමික පිළිබඳ අදාල තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි. | ප්‍රමිත අංක 24 අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශයන්හි ආශ්‍රිත පාර්ශවයන් සම්බන්ද ගණුදෙනු හෙලිදරව් කිරීමට කටයුතු කර ඇති අතර 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන් හි ද (මූල්‍ය ප්‍රකාශන පිටු අංක 18 – 9 ශිර්ෂය) එසේ හෙලිදරව් කිරිමට කටයුතු කර ඇත.කෙසේ වුවද මෙහි පෙන්වා දි ඇති පරිදි පාරිශ්‍රමිකයින් පිළිබඳ තොරතුරු ඉදිරි වර්ෂයේ සිට | ප්‍රමිතියේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 79 වගන්තිය අනුව භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.3,301,748,267 ක් වූ දේපල පිරියත හා උපකරණ වල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | මෙ යටතේ දක්වා ඇති රු.3,301,748,267.00 ක් වූ ස්ථාවර වත්කම්වලට අදාල විස්තර මූල්‍ය ප්‍රකාශනයෙහි පිටු අංක 26 හා 27 පිටුවල සටහන 08 යටතේ දක්වා ඇති අතර විස්තාරත්මක ලේඛන උපලේඛනයෙහි ඇතුලත්ව ඇත. තවද මේ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල පිට අංක 08 3.3 සටහන මගින් ද අණාවරණය කර ඇත. | ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලයට අදාල නිකුත්කරන ලද වටිනාකම රු.14,044,703 ක අවලංගු චෙක්පත් සමාලෝචිත වර්ෂය තුළ දී විවිධ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ආදායම් නිවැරදිව හදුනා ගත යුතුයි. |

**1.5.4 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ පැවති අලාභය 2018 වර්ෂයේ දී රාජ්‍ය ප්‍රදානය හේතුවෙන් ලාභ ලැබුවද පසුගිය වර්ෂ 05 ක් තුළ සංස්ථාව දිගින් දිගටම අලාභ ලබමින් පැවතුණි.2017 වර්ෂය අවසානයට රු.316,510,538 ක් වූ බැංකු අයිරාව 2020 වර්ෂයේ රු. 258,728,044 ක් වී සමාලෝචිත වර්ෂය අවසානයට රු. 237,068,873 ක් වී තිබුණි. මෙසේ දිගින් දිගටම අලාභ ලැබීම ශුද්ධ වත්කම් හා හිමිකම් වලට අහිතකර ලෙස බලපා තිබුණු අතර ඒ හේතුවෙන් රාජ්‍ය මූල්‍ය සහයක් නොමැතිව සංස්ථාව පවත්වාගෙන යාමේ අවිනිශ්චිත තාවයක් පවතින බව නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොමැත | සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට බලපාන අලාභ අඩුකර ගැනීමට කඩිනමින් ක්‍රියාකළ යුතුය. |

**1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| - | - | (අ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.377,270,977 ක්වූ සේවදායක ණයගැති ශේෂයෙන් රු.175,329,456 ක් රාජ්‍ය ආයතන මගින් ද රු. 201,941,521 ක් පෞද්ගලික ආයතන මගින් නියෝජනය වී තිබුණු අතර රාජ්‍ය ආයතන මගින් නියෝජනය වූ රු. 88,959,971 ක ණයගැති ශේෂ සහ පෞද්ගලික ආයතන මගින් නියෝජනය වූ රු.110,410,603 ක ණයගැති ශේෂ සනාථ කර ගැනීමට වෙනත් විගණන පටිපාටිවලින් ද නොහැකි විය. | පිළිතුරු සපයා නොමැත. | ණයගැතියන්ගෙන් ශේෂ සනාථන කැඳවීමට කටයුතු කළ යුතුය |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 377,267,803 ක් වූ සේවාදායක ණයගැති ශේෂය තුළ ඇතුළත් වසර 4 ඉක්මවා ඇති ශේෂය රු. 115,553,535 ක් වූ ඉන් රු. 38,958,322 ක් සඳහා පමණක් නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණි. මුළු ණයගැති ශේෂයෙන් රු. 152,166,097 ක් මිලියන 5ට වැඩි වටිනාකම් සහිත රාජ්‍ය ආයතන 08 ක් ඇතුලුව ණයගැතියන් 15 දෙනෙකුගෙන් සමන්විත වී තිබුණි. එහි ඇතුලත් ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමග එළඹී විධිමත් ගිවිසුමක් | රාජ්‍ය ආයතන වෙතින් අයවීමට ඇති ණය මුදල් ලබා ගැනීම සඳහා නිතිමය පියවර නොගෙන අදාල අමත්‍යාංශ ලේකම්වරයා මගින් ආයතන සමග සාකච්ඡා කර විසඳුම් ලබා ගන්නා ලෙස නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ලැබී ඇත. ඒ අනුව ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් අයවීමට ඇති රු.මි.10 මුදල අය කර ගැනීම සම්බන්ධව ඉදිරි පියවර ගැනීමට ජනමාධ්‍ය අමාත්‍යංශය වෙත යොමු කිරීමට කටයුතු කරන ලදී. අය විය යුතු රාජ්‍ය ණය සම්බන්ධව 2019.09.09 දින ජනමාධ්‍ය අමාත්‍යංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පැවති අතර එහිදී ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඉහළ | ණය ගැති ශේෂ අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| නොමැති වීම නිසා බැංකුවෙන් ලැබිය යුතු රු. මිලියන 10 ක් අයකර ගැනීමට නීතිමය පියවර ගනු ලැබුවද අය කර ගැනීම අවිනිශ්චිත වී තිබුණි. | නිලධාරියෙකු පවසා ඇත්තේ බැංකුවේ ලිඛිත අනුමැතියක් සහිතව මෙම කාර්ය සිදු කර නොමැති බැවින් එයට අදාලව ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් ගෙවීම් කිරිමට නොහැකි බවයි. | |
| (ආ) 2021 දෙසැම්බර් 31 දින වන විට රු.38,958,322 ක් අයකර ගැනීම සඳහා සංස්ථාව විසින් සේවාදායක ණයගැතියන් 16 දෙනෙකුට එරෙහිව නඩු පවරා තිබුණු අතර නීතිඥ ගාස්තු වශයෙන් රු.1,495,500 ක් ගෙවා තිබුණි. කාලාවරෝධ පනත අනුව වසර 6 ක් ඉක්මවීමට ප්‍රථම නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට වසර 5 ඉක්මවූ ණයගැති ශේෂය රු.100,130,139 කින් රු.12,075,596 ක් අයකර ගැනීම සඳහා පමණක් නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ණය අයකර ගැනීම සඳහා අප්‍රමාදව කටයුතු කළ යුතුය. |

**1.6.2 අත්තිකාරම්**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) වගන්තිය ප්‍රකාරව එක් අවස්ථාවක දී ලබා දිය හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු. 100,000 ක් වුවද වැඩසටහන්, නවාතැන් පහසුකම් සැපයීම් සහ මිල දී ගැනීම් වැනි කටයුතු සඳහා අවස්ථා 12 කදී සීමාව ඉක්මවා රු. 6,944,462 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දි තිබුණි. | වැඩසටහන් නිෂ්පාදන ක්‍රියාවලියේදී විශාල මුදලක් වැය වන නිසා වැඩසටහන් නිෂ්පාදකවරුන්ට අතුරු අග්‍රිම සීමා ඉක්මවා අත්තිකාරම් ගෙවීමට 2015/12/15 දිනැති අංක 806.07.02 සංස්ථා මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාගෙන ඇත. උක්ත අත්තිකාරම් සීමා ලිහිල් කිරීම සම්බන්ධයෙන් අනුමැතිය ඉල්ලා මහා භාණ්ඩාගාර ලේකම්වරයා වෙත 2016.02.10 දින ලිපියක් යොමු කර ඇති අතර මේ සම්බන්ධයෙන් නැවත සිහිකැඳවීමේ ලිපියක් 2016.12.23 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති නමුත් මෙතෙක් ඒ සඳහා ද පිළිතුරු ලැබී නොමැත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල විය යුතුය |
| (ආ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) සහ 371 (5) වගන්තිය | සංස්ථාවේ වැඩසටහන් නිෂ්පාදන ක්‍රියාවලියේ ස්වභාවය අනුව ප්‍රායෝගිකව එසේ කල නොහැකි අවස්ථාවලදී ඉහළ කළමණාකාරිත්වයේ අනුමැතිය මත | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| ප්‍රකාරව අදාළ කාර්ය නිමකර දින 10ක් ඇතුළත ලබාගත් අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත් , සමාලෝචිත වර්ෂය අවසානය වන විට වර්ෂය ඉක්මවූ අත්තිකාරම් ශේෂය රු. 16,117,304 ක් විය | අත්තිකාරම් පියවීමට අමතර කාලයක් ලබාදෙනු ලැබේ. අත්තිකාරම් නොපියවන අවස්ථාවල වැටුප් අත්හිටුවීම හා නියමිත දිනට නොපියවන ලද අත්තිකාරම් වෙනුවෙන් දඩ මුදල් අයකිරිම වැනි විනයානුකූල පියවර ගනුලැබේ. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 2015 මැයි 25 දිනැති අංක PED 1/ 2015 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | ප්‍රවාහන හා ඉන්ධන දීමනා සඳහා හිමිකම් නොමැති මධ්‍ය කළමනාකරණ, කණිෂ්ඨ කළමනාකරණ හා කළමනාකරණ සහායක ගණයේ හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් 90 දෙනෙකුට ප්‍රවාහන හා ඉන්ධන දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂය තුළ දී රු.7,008,171 ක් ගෙවා තිබුණි. | සංස්ථාව ආරම්භයේ සිට ලබා දී තිබූ වරප්‍රසාදයක් වන බැවින් අඛණ්ඩව ගෙවීම් සිදු කර ඇති අතර 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පණතේ 12.1 වගන්තිය යටතේ පැවරි ඇති බලතල අනුව සංස්ථා මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසුව මෙම දීමනාව ගෙවීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කළ යුතුය. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන චක්‍ර ලේඛයේ 6.5.1 ඡේදය | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල යුතු කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2022 ජුලි 20 දින වන විට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂයේ මුල් භාගයේ දී සේවයේ සිටි සභාපතිවරයා ඉවත් වීම නිසා 2021 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව (කෙටුම්පත) සඳහා සංස්ථා සභාපතිවරයාගේ පණිවුඩය සටහන් කර ගැනීමට ද ප්‍රමාද වූ බැවින් කෙටුම්පත් වාර්තාව ඉදිරිපත් කිරීමට ප්‍රමාද විය. කෙටුම්පත් වාර්ෂික වාර්තා 2022.08.19 දින පැවැත්වීමට නියමිත සංස්ථා මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමෙන් පසුව ඉදිරිපත් කල හැකි වේ. | චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කළ යුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් දිනට එක් ජංගම ගිණුමකට අදාලව බැංකු අයිරාව රු. 237,068,873 ක් වූ අතර ඒ සඳහා රු. 22,480,822 ක අයිරා පොලී සංස්ථාව විසින් | රට තුල පැවති අයහපත් ආර්ථික තත්වය හමුවේ රූපවාහිනී සංස්ථාවේ ප්‍රධාන ආදායම් මාර්ගය වන ගුවන් කාල විකුණුම් ආදායමද පහල | වියදම් නිවැරදිව කළමනාකරණය කිරීම සඳහා කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ගෙවා තිබුණි.එසේම සමාලෝචිත වර්ෂයේ මාස 07 ක් අනුමත අයිරා සීමාව වරින් වර ඉක්මවා තිබුණි. | මට්ටමක පැවති බැවින් සංස්ථාවේ පුනරාවර්තන වියදම් පියවා ගැනීම පිණිස මෙහි සඳහන් පරිදි වරින් වර බැංකු අයිරා පහසුකම් ලබා ගැනීමට සිදු විය | |

## 1.9 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 03.(1) වගන්තිය අනුව වැඩිපුර ගෙවන ලද ආර්ථික සේවා ගාස්තු එළඹෙන වර්ෂ 02 ක් තුල දී ගෙවන ලද ආදායම් බදු වලින් හිලව් කර ගත හැකි වුවද ආදායම් බදු නොගෙවීම නිසා හිලව් කර නොගත් 2018 හා 2019 වර්ෂ වල වැඩිපුර ගෙවන ලද ආර්ථික සේවා ගාස්තු රු.22,225,059 ක් අත්තිකාරම් හා තැන්පතු යටතේ දක්වා තිබුණි. එසේම උපචිත ආර්ථික සේවා ගාස්තු එකම කාර්තුවක් තුල කලින් ගෙවන ලද අත්තිකාරමක් සමඟ හිලව් කරගත හැකි වුවද සමාලෝචිත වර්ෂයට පෙර සිට පැවත එන රු.1,194,747ක ආර්ථික සේවා සමාලෝචිත වර්ෂය තුල දී හිලව් කර තිබුණි. | 2022 වර්ෂයේදී මෙම වටිනාකම අත්තිකාරම් ගිණුමෙන් ඉවත් කර අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කරනු ලැබේ. ඇස්තමේන්තු කරන ලද කාර්තුවෙහි අවසන් මාසයේ සත්‍ය වටිනාකම ගණනය කිරීමෙන් පසුව එලඹෙන ඊළඟ කාර්තුවේදී නිවැරදි කරනු ලැබේ | මූල්‍ය තත්වය නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 227,342,397 ක පාඩුවක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පාඩුව රු. 234,300,093 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 6,957,696 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විකුණුම් ආදායම රු. 95,256,030 කින් ඉහළ යාමත් විකුණුම් පිරිවැය, බෙදාහැරීමේ පිරිවැය, පරිපාලන වියදම්, මූල්‍ය වියදම් පිළිවෙලින් රු. 30,778,419 ක් රු.14,819,787 ක් රු. 19,001,033 ක්, සහ රු. 15,106,870 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

අවිධිමත් කළමනාකරණ හා මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් සංස්ථාව දිගින් දිගටම අලාභ ලබන පසුබිමක සමාලෝචිත වර්ෂයේ ඉකුත් වර්ෂයට සාපේක්ෂව සාංවත්සරික වියදම්,කාර්යාල අවශ්‍යතා,වේදිකා නිර්මාණ හා සැකසුම් වියදම්,ශබ්ද උපකරණ කුලියට ලබා ගැනීමේ වියදම් සහ නවාතැන් වියදම් පිළිවෙලින් රු.3,007,498 ක් හෙවත් සියයට 439 කින්,රු.3,114,578 ක් හෙවත් සියයට 64 කින්, රු.930,224 ක් හෙවත් සියයට 237 කින්, රු.2,123,500 ක් හෙවත් සියයට 264 කින් ද, රු.351,500 ක් හෙවත් සියයට 220 කින් ද වැඩි වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

(අ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ දළ ලාභ අනුපාතය හා ශුද්ධ ලාභ අනුපාතය සෘණ අගයක් ගෙන තිබුණු අතර ජංගම අනුපාතයද අඩු වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

(ආ) 2020 වර්ෂයේ දී සෘණ 17.38 ක් ව පැවති පොලී ආවරණ අනුපාතය සමාලෝචිත වර්ෂයේ දී සෘණ 14.72ක් වී තිබුණි. සංස්ථාව අඛණ්ඩව අලාභ ලබන තත්වය තුළ පොලී ගෙවීම හා අධිතෝලනය සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම සඳහා අවදානම් සහගත බලපෑමක් ඇති කරනු ලබන බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ නිල මාධ්‍ය විකාශක ලෙස මාධ්‍ය ආවරණය ප්‍රතිවෙළඳ ගිවිසුම්වලට යටත්ව සහභාගීවූ සංස්ථා නිලධාරීන් සිව් දෙනෙකු වෙත අනුග්‍රාහක ආයතනයෙන්ද දීමනා ගෙවා ඇති බැවින් ගෙවූ රු.714,560 ක අනියම් දීමනා නැවත අයකර ගැනීමට අනුමැතිය ලැබී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මුදල අයකරගෙන නොතිබුණි. ලාභ ඉපයීමට හැකි අවස්ථාවන් නිවැරදිව කළමනාකරණය නොකිරීම නිසා ඔලිම්පික් උළෙලේ මාධ්‍ය ආවරණය තුළින් සංස්ථාව රු.77,946,276 ක අලාභයක් ලබා තිබුණි. | සංස්ථාවෙන් ලබාදුන් රු.714,560 ක අනියම් දීමනාව ආපසු අයකර ගැනීමට අනුමැතිය ලබාදී ඇත. ජාත්‍යන්තර තරඟාවලියක් වන ඔලිම්පික් උළෙල අප රටෙහි ප්‍රේක්ෂක ජනතාවට නැරඹීමට අවස්ථාව දීම ජාතික නාලිකාව ලෙස සෑම වර්ෂයකදීම කටයුතු කර ඇති නමුත් අනුග්‍රාහක දායකත්වය ලබාදීමට සේවාදායක ආයතන ඉදිරිපත් නොවන බැවින් මෙම තරඟාවලිය විකාශයෙන් අලාභ විඳීමට සිදු වි ඇත. | ලාභ ඉපයීමට හැකි අවස්ථාවන් නිවැරදිව කළමනාකරණය කර ගැනීමට සංස්ථාව කටයුතු කළ යුතුය. |
| (ආ) කතෘ අයිතිය සංස්ථාව සතු විය යුතු ඉහළ ප්‍රේක්ෂක ආකර්ෂණයකට හිමිකම් කියන විදේශීය ටෙලි නාට්‍ය හා ළමා කාටුන් වැඩසටහන් හා සංස්ථාවේ දර්ශන පුස්තකාලයෙන් පමණක් ලබාගත හැකි දෘශ්‍ය තැටි අනවසරයෙන් බාහිර පාර්ශවයන් අතට පත්වීම වලක්වාගැනිම සඳහා විධිමත් ආරක්ෂණ වැඩපිළිවෙලක් හා අභ්‍යන්තර පාලන ක්‍රමයන් සංස්ථාව විසින් ස්ථාපිත කර නොතිබුණි. | මෙම වාර්තාවේ සඳහන් කර ඇති පරිදි විදේශීය ටෙලි නාට්‍ය හා ළමා කාටුන් වැඩසටහන් සඳහා මුල් කතෘ අයිතිය සංස්ථාව සතු නොවන අතර එම වැඩසටහන් නිෂ්පාදනය කරන ලද මුල් සමාගමට එහි අයිතිය හිමි වේ. නිශ්චිත කාලයක් තුල අදාල වැඩසටහන් විකාශය කිරීමේ අයිතිය පමණක් අදාල වැඩසටහන් නිෂ්පාදිත සමාගමෙන් ලබාගෙන ඇත. එබැවින් අදාල ගිවිසුම් කාලය අවසන්වීමෙන් පසුව සංස්ථාවට අදාල වැඩසටහන් සඳහා හිමිකම් කීමේ අයිතියක් නොමැත. | විධිමත් ආරක්ෂණ වැඩ පිළිවෙලක් ස්ථාපිත කළයුතු අතර මනා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 දෙසැම්බර් 31 දිනට සංස්ථා නිලධාරීන් 126 දෙනෙකු විසින් සංස්ථාව වෙත ආපසු භාර නොදුන් කැසට්පට සංඛ්‍යාව 1128 ක් වන අතර ඒවායේ වටිනාකම රු. 25,652,767 කි. | නිෂ්පාදන කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ට නිකුත් කර ඇති සමහර කැසට්පට රාජකාරී අවශ්‍යතාවය මත නිලධාරීන් භාරයේ තබාගෙන ඇති අතර ලබාගත් කැසට්පට ආපසු භාර දීමට සැම සති දෙකකට වරක්ම සිහි කැඳවීම් ලිපි යැවීමට පුස්තකාලය විසින් කටයුතු කර ඇත.<br>දිගුකලක් නැවත භාර නොදුන් කැසට්පට වල වටිනාකම වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කරන බව දන්වා ලිපි යැවීමට කටයුතු කර ඇත. | ආපසු භාර නොදුන් කැසට්පට ආපසු ලබා ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව විසින් දේශීය ටෙලිනාට්‍ය 08 ක් රු.67,389,000 කට මිළ දී ගෙන ගුවන් කාල ආදායම ලෙස රු.53,473,222ක් උපයා තිබුණ ද එම ටෙලිනාට්‍ය විකාශය සඳහා දරණ ලද මුළු වියදම රු.73,977,848 ක් වූ බැවින් දේශීය ටෙලිනාට්‍ය විකාශන අලාභය රු.20,504,626 ක් විය. | ජාතික රූපවාහිනියේ විකාශය වන ටෙලි නාට්‍ය සඳහා පෞද්ගලික නාලිකාවන්හි විකාශය වන ජනප්‍රිය ටෙලි නාට්‍ය මෙන් ඉහළ ප්‍රතිචාර (LMRB Rating) ලබා නොගන්නා බැවින් ආදායම් මට්ටමද අඩු වේ. | ටෙලිනාට්‍ය විකාශකයේ දී අලාභයක් සිදු නොවන පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) සේවා දායකයින් වෙත ගුවන් කාලය අලෙවි කිරීම නිලධාරීන් 18 දෙනෙකු සහිත අලෙවි අංශයේ ප්‍රධාන කාර්ය වුවද සමාලෝචිත වර්ෂයේ විකාශය කරන ලද ටෙලි නාට්‍ය හා වැඩසටහන් මගින් රු.104,180,629 ක අලාභයක් ලබා තිබීම තුලින් අලෙවිකරණ අංශයේ අවම කාර්යසාධනයක් නිරීක්ෂණය විය. | අලෙවි අංශයේ අලෙවිකරණ කටයුතු සඳහා නිලධාරීන් 13 ක් සෘජුවම සම්බන්ධ වේ.<br>රූපවාහිනී නාලිකාවේ විකාශය වන ටෙලි නාට්‍ය හා අනෙකුත් වැඩසටහන් ඉහල ගුණාත්මක භාවයකින් යුක්ත වුවද ගුවන් කාල අලෙවිකරණ වෙළඳපොළ ප්‍රේක්ෂක ප්‍රතිචාර හා ඉල්ලුම මත රඳා පවතී. තරඟකාරී වෙළඳපොළ තුල ජාතික රූපවාහිනියේ විකාශය වන ටෙලි නාට්‍ය හා අනෙකුත් වැඩසටහන් සඳහා වන ඉල්ලුම සාපේක්ෂව අඩු බැවින් එම වැඩසටහන් මගින් ලාභ ඉපයීමද අපහසුවී ඇත. කෙසේ වුවද එවන් තරඟකාරි තත්වයක් තුල වුවද විවිධ අලෙවි උපක්‍රම භාවිතා කරමින් ආදායම් ඉපයීමට අලෙවි අංශය කටයුතු කරනු ලැබේ | අලෙවි අංශයේ කාර්යසාධනය ඉහල මට්ටමක පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ)1971 අංක 38 දරන මුදල් පනතේ 7(1) ඡේදයේ සඳහන් පරිදි ආදායම් ගිණුමේ | පිළිතුරු සපයා නොමැත | මුදල් පනතේ විධිවිධාන |

| | | |
|---|---|---|
| අන්ත අතිරික්තය එම ගිණුමේ අන්ත ඌනය අවුරුදු 5 ක කාල සීමාවක් තුළ හෝ මුදල් ඇමතිවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි මොනයම් කාලසීමාවක් තුළ පියවීමට ප්‍රමාණවත් වන පරිදි නීතිගත සංස්ථාවේ කටයුතු පවත්වාගෙන යාම එම නීතිගත සංස්ථාවේ පාලක මණ්ඩලයේ වගකීම වුවද ආසන්නතම වර්ෂ පහක ශුද්ධ අලාභය රු.1,345,535,662 ක් වූයෙන් සංස්ථාවේ ක්‍රියාකාරීත්වය එම අපේක්ෂිත තත්වයට ළඟාවී නොමැති බව නිරීක්ෂණය විය. | | ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අලාභ තත්වය මගහරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාව විසින් OB බස්රථය සඳහා කැමරා චේන් 6ක් මිලදී ගැනීම හා මැදිරි අංක 03 සඳහා පෙඩස්ටල් 03ක් සහ ට්‍රයිපොඩ් 01ක් මිලදී ගැනීම වෙනුවෙන් සිදු කරන ලද එකතු වටිනාකම වූ රු.91,299,287ක් වූ ප්‍රසම්පාදනයේදී ගෙවීම් සිදුකිරීමට පෙර අදාල භාණ්ඩ වල යෝග්‍යතාවය පරීක්ෂාකර පිළිගැණුම් සහතිකය නිකුත්කර නොතිබුණි | OB බස් රථය සඳහා වූ කැමරා චේන්වලට අදාල භාණඩ ඉංජිනේරු අංශයේ නිලධාරීන් විසින් පරීක්ෂා කර පිළි ගැණුම් සහතිකය 2021.04.29 දින සැපයුම්කරුට නිකුත් කර ඇත. මේ සඳහා වන ගිවිසුම් අංක 722(M) හි (මුල් පිටපතෙහි) දිනය 2020.11.12 ලෙස සඳහන් වේ | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ක්‍රියා කළ යුතුයි. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවේ ස්ථිර කාර්ය මණ්ඩලයේ තනතුරු පුරප්පාඩු 219 ක් පැවතුනු අතර අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවන තනතුරු 07 ක් සඳහා ස්ථිර, කොන්ත්‍රාත් සහ සේවා පැවරුම් පදනමින් සේවකයින් 19 ක් බඳවා ගෙන තිබුණි. එසේම අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා ස්ථිර, කොන්ත්‍රාත් සහ කාර්ය පැවරුම් පදනම යටතේ සේවකයින් 38 ක් සේවයේ යොදවා ගෙන තිබුණි. | කාර්ය මණ්ඩලය අනුමත කිරීමේදී තනතුරු දරන්නාට පමණක් පෞද්ගලික අනුමත කරන ලද තනතුරු නාම 16 ක එම අවස්ථාව වන විට සේවා යෙදී සිටි ස්ථිර නිලධාරීන් 28 ක් මේ වනවිටත් සේවයේ නිරතව සිටී.<br>සංස්ථා මණ්ඩල අනුමැතිය මත 2000 වසරේදී අලෙවි අංශය ප්‍රතිව්‍යුහගතකරණයේදී කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් අලෙවි විධායකවරුන් 11 දෙනෙකු සේවයේ නිරත වේ. සම්ප්‍රේෂණ කුළුණක ආරක්ෂක කටයුතු සඳහා සේවා පැවරුම් පදනම මත සේවයේ යොදවා තිබූ පුද්ගලයින් දෙදෙනෙකුගේ සේවය අවසන් කර ඇත. සේවක සංඛ්‍යාව අඩුවෙන් සිටින තනතුරු 06 ක ඒ වන විට සේවයේ යෙදී සිටි ස්ථිර සේවකයින් 20 ක් සිටී.<br>ස්ථිර කාර්ය මණ්ඩලයේ ඇතැම් තනතුරු සඳහා | අනුමත කාර්ය මණ්ඩලයට අයත් තනතුරු වල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | සේවා අවශ්‍යතාව මත කොන්ත්‍රාත් පදනමින් සේවකයින් 06 ක් හා සේවා පැවරුම් පදනම යටතේ සේවකයින් 12 දෙනෙකු සේවයේ යොදවා ඇත. | |

**4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 සංයුක්ත සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුකුල ප්‍රගති වාර්තාව අනුව 2020 – 2022 සංයුක්ත සැලැස්මේ අරමුණක් වූ නරඹන්නන් සංඛ්‍යව වර්ධනය කිරීමට ව්‍යාපෘති 10 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද ඉන් එක කාර්යයක පමණක් යම් ප්‍රගතියක් නිරීක්ෂණය වූ අතර අනෙකුත් කාර්යන් වල ප්‍රගතියක් අත්කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | 2021 වර්ෂයේ හා 2022 වර්ෂය තුල රටේ පැවති කොරෝනා වසංගත තත්වය හා අයහපත් ආර්ථික තත්වය හේතුවෙන් සංස්ථාවේ ආදායම් මට්ටමද සීග්‍ර ලෙස අඩු වී ඇත.<br>එබැවින් සංස්ථාවේ නව වැඩසටහන් නිෂ්පාදනය හා මිළදී ගැනීම බොහෝ දුරට අඩු වූ අතර පැරණි වැඩසටහන් ,ටෙලි නාට්‍ය ආදිය නැවත විකාශය තුලින් ගුවන් කාලය පුරවන ලදි. ඒ ක්‍රියාකාරි සැලැස්මට අනුව නරඹන්නන් සංඛ්‍යාව වර්ධනය කර ගැනීම පිණිස සැලසුම් කර තිබූ ව්‍යාපෘති ද ක්‍රියාත්මක නොවිය. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු තළ යුතුය. |

**4.2 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 ජනවාරි 01 දිනට රු.347,178,946 ක් වු සමුච්චිත අරමුදල් සෘණ ශේෂය පසුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.571,576,904 ක සෘණ ශේෂයක් දක්වා වැඩි වී තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට අයවැයගත අරමුදල් සෘණ ශේෂය රු.260,316,000 ක් හා සැසඳීමේ දී එම ශේෂයන් අතර වෙනස රු.311,260,904 කින් හෙවත් සියයට සෘණ 120% කින් වැඩි වී තිබුණි. | පිළිතුරු සපයා නොමැත | අලාභ තත්වය මගහරවා ගැනීමට කටයුතුකළ යුතුය. |